# වී ගොවියාගේ ආර්ථික සුබසාධනය සඳහා අතරමැදි කන්න භෝග වගාවේ බලපෑම - හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්

*එච්. ටී. වී. එම්. ආරියරත්න*[1]

ශ්‍රී ලංකාවේ දේශීය කෘෂිකර්මය තුළ වැදගත් වනුයේ වී වගාව හා අනෙකුත් අතිරේක භෝග වගාවයි. ඒ අතරින් වඩාත් වැදගත් වනුයේ වී වගාවයි. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම්වලින් වැඩි ප්‍රතිශතයක් වී වගාව සහ අනෙකුත් අතිරේක භෝග වගාව සඳහා යොදවා ඇති අතර ග්‍රාමීය ජනතාවගෙන් විශාල ප්‍රමාණයක් සේවා නියුක්ත ව  සිටිනුයේ ද දේශීය කෘෂි අංශය තුළ ය. World Bank, 2009ට අනුව ලෝකයේ දුප්පතුන්ගෙන් 75%ක් කෘෂිකාර්මික කටයුතුවල නිරත වෙමින් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වෙති. ඒ අනුව ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය දේශීය කෘෂි අංශයේ සංවර්ධනය මත රඳා පවතී. මෙහි දී කෘෂිකාර්මික නිෂ්පාදන වැඩි කිරීම සඳහා ක්‍රම 03ක් අනුගමනය කර හැක. ඒවා නම්, වගා කර හැකි භූමි ප්‍රමාණය වැඩි කර ගැනීම, ඉඩම් අක්කරයක සාමන්‍ය ඵලදාව වැඩිකර ගැනීම හා එකම භූමියක භෝග විවිධාංගීකරණය තුළින් අස්වැන්න වැඩි කර ගැනීම වේ. වී ගොවියා  අතිරේක භෝග වගාවට නැඹුරු වීමෙන් අර්ථික සුභසාධනයේ වර්ධනයක්, ගොවිපල ඵලදායීතාව ද ඉහළ යෑමක් හඳුනාගත හැකි ය. එහෙත් ගොවියා අතිරේක ආහාර වගා කිරීම හේතුවෙන් ඔවුන්ගේ පරිභෝජනයේ ද වෙනස්කම් සිදු වේ. විශේෂයෙන් රනිල ශාකවල ශාරීරයට හිතකර පෝෂ්‍ය පදාර්ථ රැසකින් අනූන වීමෙන් ගොවියාගේ කුටුම්බයේ ආහාර සුරක්ෂිතභාවයක් හට ගනු ලැබේ.  තව ද ගොවියාට ඊළඟ කන්නය වන මහා කන්නයට පොහොර භාවිතය අවම වන බැවින් පොහොර සඳහා දරන පිරිවැය යම්තාක් දුරට අවම කර හැකි ය. එසේ ම පොහොර කාර්යක්ෂමතාව ඉහළ යෑම තුළින් මහ කන්නයේ භෝග අස්වැන්නේ ඉහළ යෑමක් සිදු වේ. මෙවැනි විශාල ප්‍රතිලාභ ප්‍රමාණයක් මැද කන්නයේ අතිරේක භෝග වගාව මඟින් ලැබේ. මේවැනි පසුබිම නිෂ්පාදක ආර්ථික සුභසාධනයට අතරමැදි කන්නයේ බලපෑම අධ්‍යයනය කිරීමේ අරමුණ හා අතරමැදි කන්නයේ බෝග වගා කරන සහ නොකරන ගොවීන්ගේ සමාජ ආර්ථික පසුබිම, අතරමැදි කන්නයේ භෝග වගාවේ ප්‍රතිලාභ තීරණයට හා අතරමැදි  කන්නයේ බෝග වගාවේ සීමාවන් හඳුනා ගැනීමත් මෙහි සෙසු අරමුණු වේ. එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා, ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමය යටතේ හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසටය් ග්‍රාම නිලධාරී වසම් 30ක් අයත් වන අතර එම වසම්  පහසු නියැදීමෙන් තෝරා, එම තෝරා ගත් වසමේ සමස්ත වී නිෂ්පාදන ගොවියන් අතුරින්, පහසු නියැදීමෙන් නියදිය සඳහා වී වගා කරන ගොවියන් අතුරින් සමස්ත සංගහනය නියෝජනය වන පරිදි ගොවියන් 30කගේ නියැදියෙන් දත්ත රැස්කිරීමට සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලි ක්‍රමය යොදා ගෙන, දත්ත විශ්ලේෂණය කිරීම සඳහා අදායම් වියදම් ඇස්තමේන්තු තුළින්, ඇස්තමේන්තුවෙන් අතරමැදි කන්න වගාවෙන් මාසික ආදායම රු.  16461.11ක් වන බවත් යල හා මහ කන්න දෙක ම වගා කිරීමෙන් මාසික ව ලැබෙන ආදායම වනුයේ රු. 7166.67 බවත්. (නියැදි සමීක්ෂණයට අනුව) ඒ තුළින් යල හා මහ කන්න දෙකෙහි ම ලාභයට වඩා වැඩි ලාභයක් අතරමැදි කන්න වගා කිරීමෙන් ලැබෙන බව හා දෙවන විශ්ලේෂණය වූ ප්‍රතිපාදන විශ්ලේශනය තුළින් ස්වායත්ත විචල්‍ය වන වියදම එක් ඒකයකින් ඉහළ යන විට පරායත්ත විචල්‍ය වන ආදායම 0.758කින් වැඩි වන බව, ස්වායත්ත විචල්‍ය වන වියදම එක් ඒකයකින් ඉහළ යන විට පරායත්ත විචල්‍ය වන ආදායම 1.750කින් වැඩි වන බව හා මේ අනුව වියදම් වැඩි කිරීමට සාපේක්ෂ ව වැඩි වේගයකින් ආදායම වැඩි වනුයේ අතරමැදි කන්නයේ බව නිගමනය විය. යුගල t පරීක්ෂාවෙන් අතරමැදි කන්නයට පෙර ආදායමේ මධ්‍යනය  86000 (SD63141.876) , අතරමැදි කන්නයත් සමඟ පසු ආදායමෙහි සාමන්‍ය 283533.33 (SD75892.612) වේ. එයින් පෙන්නුම් කරන්නේ අතරමැදි කන්නයත් සමඟ ගොවියාගේ ආදායම සැලකිය යුතු වර්ධනයක් සිදු ව ඇති බව සංඛ්‍යාත්මක ව නිගමනය කළ හැකි බවයි. අවසාන වසයෙන් අතරමැදි කන්න වගාව ප්‍රවර්ධනයට, අතරමැදි කන්නය සඳහා ගොවියාට ලැබෙන රාජ්‍ය අනුග්‍රහය වැඩි කිරීම, මූල්‍ය ආයතන මගින් එම ගොවියන්ට ලබා දෙන සහයෝගය වැඩි කිරීමට රාජ්‍ය උපදෙස් ලබා දීම, ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ඔවුන් දිරිමත් කිරීම හා අවශ්‍ය උපදේශන සේවා සැපයීම යන නිර්දේශ ද ඉදිරිපත් කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** ආර්ථික සුභසාධනය, අතරමැදි කන්නය

---

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. virajimadushika1@gmail.com